

ISSN 2012 - 5054

මැයි, 2023

# TVEC පුවත්

ඇතුළත් වූ

- ශ්‍රී ලංකාවේ වෘත්තීය පුහුණුවේ මාවත කෙබඳු විය යුතුද?
- ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) නොවන ඩිප්ලෝමා හා උසස් ඩිප්ලෝමා පඨමාලා NVQ මට්ටම් වලට ගැළපීම (MAPPING)
- සංවර්ධනය කරන ලද සහ යාවත්කාලීන කරන ලද ජාතික නිපුණතා සම්මත සහ විෂය මාලා - 2022
- NVQ ක්‍රමවේදය තුලින් නිපුණතාවයට හා සේවා පළපුරුද්දට නිපුණතා බලපත්‍රයක්
- Mature Candidate Route මඟින් අධීක්ෂණ මට්ටමේ සේවා පළපුරුද්ද සහිත අයදුම්කරුවන්ට NVQ Level 5 මට්ටමට සමාන සුදුසුකම් ප්‍රධානය කිරීමේ ක්‍රමය
- වෘත්තීය මාර්ගෝපදේශන සේවාව නියාමනය තුලින් ඉහළ ගුණාත්මක සේවාවක් ලබා දීම

**2023 මැයි මස 15 වන දින තෙක් නිකුත් වූ NVQ සහතික ප්‍රමාණය : 661,615**

කතෘ මණ්ඩලය

**පී.ඒ.එම්.යු. ගනේපොල මහතා** - *අධ්‍යක්ෂ*
*තොරතුරු පද්ධති අංශය*

**මංජුල විදානපතිරණ මහතා** - *වැඩ බලන අධ්‍යක්ෂ*
*කර්මාන්ත සම්බන්ධතා අංශය*

**පී.පී.පී. නනායක්කාර මහත්මිය** - *වැඩ බලන අධ්‍යක්ෂ*
*තත්ත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය*

**අනුර වීරකෝන් මහතා** - *නියෝජ්‍ය අධ්‍යක්ෂ*
*තොරතුරු පද්ධති අංශය*

**දමයන්ති වික්‍රමසිංහ මහත්මිය** - *නියෝජ්‍ය අධ්‍යක්ෂ*
*ජාතික වෘත්තීය සුදුසුකම් අංශය*

**ඉන්දික සම්පත් මහතා** - *වැඩ බලන සහකාර අධ්‍යක්ෂ*
*තොරතුරු පද්ධති අංශය*

**සමන් වික්‍රමසිංහ මහතා**- *සහකාර අධ්‍යක්ෂ*
*සැලසුම් සහ පර්යේෂණ අංශය*

**නදීෂ් ද සිල්වා** - *සහකාර අධ්‍යක්ෂ*
*සැලසුම් සහ පර්යේෂණ අංශය*

**ප්‍රියන්ත ධර්මසේන** - *සහකාර අධ්‍යක්ෂ*
*සැලසුම් සහ පර්යේෂණ අංශය*

**අනුෂා ද සිල්වා මහත්මිය** - *සහකාර අධ්‍යක්ෂ*
*තත්ත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය*

**භාෂිනී විතානගේ මහත්මිය** - *සහකාර අධ්‍යක්ෂ*
*ජාතික වෘත්තීය සුදුසුකම් අංශය*

**උපේක්ෂා විජේබණ්ඩාර** - *සහකාර අධ්‍යක්ෂ*
*ජාතික වෘත්තීය සුදුසුකම් අංශය*

**පරිගණක චිත්‍රණය හා පිටු සැලසුම්**
- **විමර්ශී රම්මාවඩු** - *තොරතුරු තාක්ෂණ සහකාර*
- **ඩබ්ලිව්.එල්.ඩී. ඉමාෂි මින්සඳි** - *පුහුණු*

# ශ්‍රී ලංකාවේ වෘත්තීය පුහුණුවේ මාවත කෙබඳු විය යුතුද?



සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාවේ විධිමත් අධ්‍යාපන ක්‍රමයේ බොහෝ අංශ රැකියා වෙළඳපොළට නොගැලපීම හේතු කොටගෙන අධ්‍යාපන ක්‍රමය සහ රැකියා අවස්ථා අතර පැහැදිලි පරතරයක් තිබෙන බව පර්යේෂණ මඟින් හඳුනාගෙන ඇත. එබැවින් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ රැකියා ඉල්ලුමට ප්‍රමාණවත් ශ්‍රම බලකායක් විධිමත් අධ්‍යාපනය හරහා බිහි නොවීමෙන් රැකියා සඳහා බඳවා ගැනීමේ දී ගැටළුකාරී තත්වයකට ආයතන මුහුණ දී ඇත.

එසේම 2021 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය තුල කුසලතාවයක් නොමැති ප්‍රමාණය 2,100,000 ආසන්න බව හඳුනාගෙන ඇති අතර මෙම ප්‍රමාණය ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායෙන් 25% ක් බව පෙන්නුම් කර ඇත.

මෙම තත්වයන්ගෙන් මිදීම සඳහා වෘත්තීය පුහුණුව ඉතා වැදගත් සාධකයක් බව හඳුනාගෙන ඇති අතර වර්තමානය වන විට බොහෝ රැකියා විරහිත තරුණ තරුණයින් වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා යොමු වීමේ ප්‍රවණතාවය වැඩි වී ඇත. එසේම කුසලතාවයක් නොමැති ශ්‍රම බලකාය කුසලතාවයෙන් පරිපූර්ණ පිරිසක් බවට පත්කිරීමේ හැකියාව වෘත්තීය පුහුණුවට පවතින බව රාජ්‍ය හා පෞද්ගලික අංශ අවබෝධ කරගෙන ඇත. මෙම කටයුත්තේ දී රාජ්‍ය හා පෞද්ගලික ආයතන විසින් වෘත්තීය පුහුණුව හරහා වාර්ෂිකව තරුණ තරුණියන් 175,000 ට ආසන්න ප්‍රමාණයක් ශ්‍රම වෙළඳපොළට දායාද කරයි.

නමුත් 175,000 ආසන්න තරුණ තරුණියන් පිරිසක් වාර්ෂිකව වෘත්තීය පුහුණුව හරහා දායාද කළද වෘත්තීය පුහුණුව අවසන් කරන විශාල ප්‍රමාණයක් රැකියා විරහිතව පසුවන බව අධ්‍යයනයන් තුළින් හඳුනාගෙන ඇත. එසේම වෘත්තීය පුහුණුව අවසන් කළ පිරිස රැකියාගත වීම සංඛ්‍යාත්මකව හඳුනාගැනීම සඳහා පසු විපරම් ක්‍රමවේදයක් නිසි පරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන්, ඉහත සාකච්ඡා කළ රැකියා විරහිත වීමට එරෙහිව තාර්කිකව නිගමනය කිරීමට නොහැකි වී ඇත.

කෙසේ වෙතත් වෘත්තීය පුහුණුව රටේ ශ්‍රම වෙළඳපොළ අනුව ක්‍රියාත්මක වේ නම් සේවා වියුක්තිය අවමකර ගැනීමේ හැකියාව පවතී. නමුත් ශ්‍රම වෙළඳපොළ වාර්තා අනුව ශ්‍රී ලංකාවේ වෘත්තීය පුහුණුව සහ ශ්‍රම වෙළඳපොළ ඉල්ලුම අතර පරතරයක් පවතින බව හඳුනාගත හැක.

ඒ අනුව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ශ්‍රම වෙළඳපොළ ඉල්ලුම පිළිබඳව සිදුකළ පුවත්පත් නියැදි සමීක්ෂණයන්ට අනුව පසුගිය වර්ෂ කිහිපයක ශ්‍රී ලංකාවේ වැඩි ඉල්ලුමක් පවතින වෘත්තීන් ලෙස ගෘහ සේවිකා, කෝකි, ලිපිකරු, භෝජනාගාර සහයක, ආරක්ෂක නිලධාරී, රියදුරු (සැහැල්ලු හා බර වාහන), ඉදිකිරීම් ශිල්පි (පෙදරේරු), උදව්කරු, මුදල් අයකැමි, විකුණුම් සහයක, කම්කරු, විකුණුම් නියෝජිත, විකුණුම්කරු (සාප්පු), පරිගණක ක්‍රියාකරු, මුලුතැන්ගේ සහයක, පෑස්සුම්කරු, සුපරීක්ෂක (සාමාන්‍ය), කාමර සේවක/සේවිකාවන්, කොත්තු සාදන්නා, බේකරිකරු, ගුරුවරු (සිංහල, දෙමළ, ඉංග්‍රීසි), සම්භාහක, මහන මැෂින් ක්‍රියාකරු, විකුණුම් විධායක යන වෘත්තීන් හඳුනාගෙන ඇත.

එසේම වෘත්තීය පුහුණුව මඟින් වාර්ෂිකව වැඩියෙන්ම පුහුණුව අවසන් කළ වෘත්තීන් ලෙස තොරතුරු

සන්නිවේදන තාක්ෂණ ශිල්පී, ඉදිකිරීම් ශිල්පී, රූපලාවන්‍ය ශිල්පී, කොණ්ඩා සැකසුම් ශිල්පී, මැහුම්, වෘත්තීය ඉංග්‍රීසි, පරිගණක යෙදුම් සහයක, විදුලි ශිල්පී, කෝකි, බේකරිකරු, නායකත්වය හා පෞර්ෂත්ව සංවර්ධනය, මෝටර් රථ කාර්මික, පෑස්සුම්කරු, පෙර පාසල් ගුරු යන වෘත්තීන් පෙන්වාදිය හැකිය.

ඉහත සඳහන් තොරතුරු අනුව වැඩිම ඉල්ලුමක් පෙන්නුම් කරන වෘත්තීන් හා වෘත්තිය පුහුණුව මඟින් වැඩිම ප්‍රමාණයක් සමාජගත කරන වෘත්තීන් අතර කැපීපෙනෙන වෙනසක් පවතින බව පැහැදිලි වේ.

පහත වගු අංක 5.1 න් පෙන්නුම් කරන පරිදි 2022 පලමු මාස 06 තුළ පුවත්පත් සමීක්ෂණයට අනුව වැඩිම ශ්‍රම ඉල්ලුමක් වාර්තාකළ වෘත්තීන් සහ වෘත්තීය පුහුණුව මඟින් සමාජගත කළ ප්‍රමාණයන් වැඩි පිළිවලේ සිට තාරාගත කර ඇත. ඒ අනුවද ඉහතින් සඳහන් කළ පරිදි ශ්‍රම ඉල්ලුම හා සැපයුම අතර කැපී පෙනෙන වෙනසක් පවතින බව පැහැදිලි වේ.

වගුව 5.1 ශ්‍රම ඉල්ලුම හා ශ්‍රම සැපයුම අනුව වෘත්තින් පෙළගැස්වීම - 2022 (1st half)

| වෘත්තීය | වැඩිම ශ්‍රම ඉල්ලුමට අනුව තාරාව | වෘත්තීය | වැඩිම ශ්‍රම සැපයුමට අනුව තාරාව |
|---|---|---|---|
| ගෘහ සේවිකා House Maid | 1 | ඉංග්‍රීසි භාෂාව English language | 1 |
| ආරක්ෂක නිලධාරී Security Officer | 2 | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ශිල්පි Information and Communication Technology Technician | 2 |
| අත් උදව්කරු Helper, General | 3 | පරිගණක යෙද-වුම් සහයක Computer Applications Assistant | 3 |
| කෝකි Cook | 4 | රූපලාවන්‍ය ශිල්පි Beautician | 4 |
| ඉදිකිරීම් ශිල්පි (පෙදරේරු) Mason (General) | 5 | ගණකාධිකරණ ඩිප්ලෝමාව Diploma in Accountancy - (HNDA) | 5 |
| රියදුරු (ට්‍රක්) Heavy Truck Driver | 6 | ඇඳුම් මසන්නා Tailor | 6 |
| මුදල් අයකැමි Cashier | 7 | විදුලි ශිල්පි Electrician | 7 |
| සම්භාහක Masseur | 8 | කොණ්ඩා සැක-සුම් ශිල්පි Hair Dresser | 8 |
| වඩු කාර්මික Carpenter | 9 | ත්‍රිරෝද රථ ශිල්පි Three Wheeler Mechanic | 9 |
| භෝජනාගාර සේවක Waiter | 10 | නායකත්ව සහ පෞර්ෂත්ව සංවර්ධනය Leadership and personality Development | 10 |
| විකිණුම්කරු Sales Workers | 11 | ඉදිකිරීම් ශිල්පි (පෙදරේරු) Construction Craftsman (Masonry) | 11 |
| වෘත්තීය රියදුරු Chauffeur | 12 | කළමණාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව Higher National Diploma in Management (HNDM) | 12 |

| වෘත්තීය | වැඩිම ශ්‍රම ඉල්ලුමට අනුව තාරාව | වෘත්තීය | වැඩිම ශ්‍රම සැපයුමට අනුව තාරාව |
|---|---|---|---|
| පෑස්සුම්කරු Welder | 13 | පරිගණක දෘඩාංග ශිල්පී Computer Hardware Technician | 13 |
| උදව්කරු (මුළුතැන්ගේ) Kitchen Helper | 14 | කෝකි Cook | 14 |
| ආරක්ෂක ප්‍රධානියා Officer In-charge (Security) | 15 | මෝටර් රථ කාර්මික Automobile Mechanic | 15 |
| විකුණුම් සහයක Sales Assistant | 16 | පෑස්සුම්කරු Welder | 16 |
| කොත්තු හදන්නා Kotthu Maker | 17 | සංචාරක සහ සත්කාරක පිළිබඳ උසස් ඩිප්ලෝමාව Higher National Diploma in Tourism & Hospitality Management - (HNDTHM) | 17 |
| වතු කම්කරු Estate Labourer | 18 | ඇළුමිනියම් පිළිසැකසුම්කරු Aluminum Fabricator | 18 |
| රියදුරු (සැහැල්ලු වාහන) Driver Light Vehicles | 19 | පෙර පාසල් ගුරු Pre-School Teacher | 19 |
| ලිපිකරු (සාමාන්‍ය) General Clerk | 20 | ජලනල කාර්මික Plumber | 20 |

මූලාශ්‍රය : පුවත්පත් සමීක්ෂණය සහ වෘත්තීය පුහුණු ආයතන-2022 (ජුනි)

කෙසේවෙතත් වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ නියාමන ආයතනය ලෙස තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ශ්‍රම වෙළඳපෙළේ වැඩිම ඉල්ලුමක් පවතින වෘත්තීන් හඳුන්වා දී ඇති අතර එයින් බොහෝ වෘත්තීන් සඳහා නිපුණතා සම්මත ද එළිදක්වා ඇත.

නමුත් වෘත්තීය පුහුණු ආයතන දේශීය සහ විදේශීය ඉල්ලුම ගැන නොසලකා සීමිත වෘත්තීන් ප්‍රමාණයකට පමණක් වෘත්තීය පුහුණුව ක්‍රියාත්මක වීම තුළ ශ්‍රම වෙළඳපොළට අවශ්‍ය ශ්‍රමිකයින් බිහිනොවන බව සංඛ්‍යාලේඛණ වලින් අනාවරණය වෙයි.

වර්තමානය වන විට ශ්‍රී ලංකාව ආර්ථිකමය වශයෙන් අභියෝග රැසකට මුහුණ දී ඇත. මෙම අභියෝග ජයගෙන ඉදිරියට ගමන්කිරීම සඳහා වෘත්තීය පුහුණුවට විශේෂ කාර්යභාර්යක් පැවරී ඇත. මෙම කාර්යයේදී රැකියා විරහිතභාවය අඩුකිරීම මෙන්ම රටට අවශ්‍ය විදේශ විනිමය වර්ධනය කිරීමේ අවශ්‍යතාව පවතී.

ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළ තුළ සේවා නියුක්තිය ඉහළ නංවා, දේශීය සහ විදේශීය ශ්‍රම වෙළඳපොළට අවශ්‍ය පුහුණු ශ්‍රමිකයන් ලබාදීමට හැකිවන පරිදි වෘත්තීය පුහුණුව ක්‍රියාත්මක කිරීමේ දැඩි අවශ්‍යතාවයක් පවතී. මේ සඳහා යල්පැනගිය පංති කාමරයට සීමා වූ පුහුණු ක්‍රමවේදයෙන් මිදී සංවර්ධිත රටවල මෙන් රැකියා පදනම් කරගත් පුහුණු ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සුදුසු වේ.

පළමුව දේශීය ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතා සපුරන පරිදි වෘත්තීය පුහුණුව නව පුහුණු ක්‍රමවේදයකින් ආරම්භ කිරීමට අවධානය යොමු කිරීම මඟින් ඉහත සාකච්ඡා කළ සේවා වියුක්තියට කාලෝචිත විසඳුමක් ලබාගත හැකිය.

ඒ අනුව දැනට ක්‍රියාත්මක මධ්‍යස්ථාන පුහුණුව සහ ආධුනිකත්ව පුහුණුව පහත පරිදි නව ආරකින් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමි.

■ පුහුණුව සඳහා අවශ්‍ය අරමුදල් රජයේ අධීක්ෂණය යටතේ කර්මාන්තවලට සෘජුවම ලබාදීම.

■ රැකියා අපේක්ෂා කරන තරුණ තරුණියන් කර්මාන්ත සහ ආයතන වල රැකියා සඳහා සෘජුවම බඳවාගෙන, පුහුණු ආයතන හරහා වෘත්තියට අදාලව මූලික පුහුණුව ලබාදීම.

■ රැකියාවේ යෙදෙන අතරතුර අවශ්‍යතාවය අනුව විටින් විට වැඩිදුර පුහුණුව ලබා දීම.

මෙම ක්‍රමවේදය හරහා

- ■ කර්මාන්තවල පුහුණු පිරිවැය අවමවීම මත, කර්මාන්ත පුහුණුව සඳහා පෙළඹීම.
- ■ නුපුහුණු ශ්‍රම බලකායක් පුහුණු ශ්‍රම බලකායක් බවට පත්වීම,
- ■ රැකියා ප්‍රශ්නය අවම වීම,
- ■ රැකියා වෙළඳපොළේ ඉල්ලුම පවතින වෘත්තීන්ට පමණක් පුහුණුව ලැබීම වැනි සාධක සපුරාලනු ලැබේ.

මෙම ක්‍රමවේදය හරහා කර්මාන්ත සහ ආයතන වලට අවශ්‍ය සේවකයන් පමණක් බිහිවීම තුළින් වෘත්තිය පුහුණුව සඳහා වැයවන පිරිවැය අවම කරගත හැකි වන අතර, ශ්‍රම වෙළඳපොළට අවශ්‍ය නිපුන ශිල්පියෙක් පමණක් බිහිවේ.

දෙවනුව විදේශීය රැකියා වෙළඳපොළ කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීමට කටයුතු කළ යුතුය. වර්තමානය වන විට විදේශීය රැකියා ඉල්ලුමට සාපේක්ෂව යොමුකිරීමට හැකි වන්නේ 10% - 15% අතර ප්‍රමාණයක් පමණි.

ශ්‍රී ලංකාව විදේශ විනිමය අර්බුදයකට මුහුණ දී ඇති අවස්ථාවක රජය මැදිහත් වී නිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව පවතී. විදේශ රැකියා සඳහා ඉහළ ඉල්ලුමක් පවතින වෘත්තීන් තෝරාගෙන වෘත්තීය පුහුණුව ක්‍රියාත්මක කළ යුතුය. විශේෂයෙන් විදේශීය රැකියා සඳහා කාර්මික දැනුමට අමතරව මෘදු කුසලතා (විශේෂයෙන් භාෂාමය) සහ බහු කාර්ය කුසලතා වර්ධනය කිරීම ද ඉතා වැදගත් වේ.

මෙම ක්‍රමවේදයන් හරහා නිපුණතා පදනම් කරගත් වෘත්තිය පුහුණුවක් බිහිවීම තුළින් රැකියා විරහිතභාවය අඩු වී රට වර්තමානයේ මුහුණ දී ඇති ආර්ථික අර්බුදයෙන් මිදී තිරසාර සංවර්ධනයක් කරා ගමන් කිරීමට අවශ්‍ය මංපෙත විවර වෙයි.





**සමන් වික්‍රමසිංහ සහකාර - අධ්‍යක්ෂ -**
*සැලසුම් සහ පර්යේෂණ අංශය*

# ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) නොවන ඩිප්ලෝමා හා උසස් ඩිප්ලෝමා
# පාඨමාලා NVQ මට්ටම්වලට ගැළපීම (MAPPING)

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රතීතනය කළ ඩිප්ලෝමා හා උසස් ඩිප්ලෝමා පාඨමාලා සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් 5 හා 6 මට්ටමේ සහතික පත්‍රයක් නිකුත් කරනු ලැබේ.







ජාතික වෘත්තීය සුදුසුකම් චක්‍රලේඛ අංක 2021/05 අනුව, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) නොවන ඩිප්ලෝමා හා උසස් ඩිප්ලෝමාවලට අමතරව පුහුණු ආයතන තුල පවත්වනු ලබන විදේශීය ඩිප්ලෝමා පාඨමාලා හා අනෙකුත් පිළිගත් ඩිප්ලෝමා NVQ 5/ 6 මට්ටමට ගැළපීම් කිරීම සිදුකරනු ලබයි. එහිදී තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක් වීම අනිවාර්යය කරුණක් වේ. එමෙන්ම මෙම සමානකිරීම් සිදුකිරීමේ දී අදාළ ඩිප්ලෝමා පාඨමාලාවල ගුණාත්මක මට්ටම මෙන්ම NVQ 5 / 6 මට්ටම්වල ජාතික නිපුණතා සම්මත හා ජාතික වෘත්තීය සුදුසුකම් රාමුවට අනුව ගැළපීම සිදුකරනු ලබයි.

2022 වර්ෂය තුළ ගැළපීම් සිදුකළ පාඨමාලා පහත පරිදි වේ.

| අංකය | ආයතනයේ නම | පාඨමාලාවේ නම | සමාන වන NVQ මට්ටම |
|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) | කළමනාකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව | මට්ටම 6 |
| 02 | ශ්‍රී ලංකා ටෙලිකොම් පුහුණු මධ්‍යස්ථානය, වැලිසර | Pearson BTEC HND (විදුලි සහ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු) | මට්ටම 6 |
| 03 | ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය (AAT) | අවසන් අදියර සමත් වූ “ව්‍යාපාර හා ගණකාධිකරණ ඩිප්ලෝමාව” | මට්ටම 5 |
| 04 | ශ්‍රී ලංකා සහතිකලත් කළමන-ාකරණ ගණකාධිකාරී ආයතනය (CMA) | ව්‍යාපාර හා ගණකාධිකරණ කළමනාක-රණ වැඩසටහන පිළිබඳ ඩිප්ලෝමාව | මට්ටම 6 |

පාඨමාලා සඳහා නිසි පිළිගැනීමක් ලබාදීම හා ඒකීය රාමුවක් ගොඩනැගීම අරමුණු කර ගනිමින් මෙම ගැළපීම් කිරීමේ ක්‍රමය තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් සිදුකරනු ලබයි.



**ආචාර්ය දිල්රුක්ෂි හේරත්** - **සහකාර අධ්‍යක්ෂ** - *ජාතික නිපුණතා සම්මත, විෂයමාලා සහ ජාතික වෘත්තීය සුදුසුකම් අංශය*

# සංවර්ධනය කරන ලද සහ යාවත්කාලීන කරන ලද ජාතික නිපුණතා සම්මත සහ විෂය මාලා - 2022

NVQ Level 1 - 4

## Newly Developed NCSs & Curricular

- Construction Equipment Operator (Crawler dozer bulldozer) – NVQ Level 3
- Construction Equipment Operator (Pump car) – NVQ Level 3
- Musician (Singer-North Indian) / Musician (Singer- Western) / Musician (Singer- South Indian) -NVQ Level 4
- Operation Theater Technician -NVQ Level 4
- Limb Appliance Technician-NVQ Level 4
- Telecommunication Tower Rigger /Telecommunication Tower Technician - NVQ Level 3 & 4
- Central Sterile Service Department Technician- NVQ Level 3 and 4
- Latex Based Products Manufacturing Technician- NVQ Level 3 and 4
- Construction Equipment Operator (Excavator Operator) - NVQ Level 3
- Medical Receptionist - NVQ Level 4
- Quick Service Restaurant (QSR) Crew Member- NVQ Level 4
- Plasterer - NVQ Level 3
- Construction Equipment Operator (Backhoe Loader /Wheel Front End Loader) - NVQ Level 3
- Satellite TV and Broadband Technician - NVQ Level 4
- Medical Laboratory Assistant - NVQ Level 3
- Sports Item Manufacturing Craftsman (Wooden) - NVQ Level 3 & 4
- Ayurveda Massage Therapist - NVQ Level 4
- Co-operative Manager - NVQ Level 4
- Pharmaceutical Manufacturing Technician - NVQ Level 4
- Stage Lighting Technician - NVQ Level 4

## Newly Developed NCSs

- Rubber Sheet Processor- NVQ Level 3
- Coconut Cultivation Assistant -NVQ Level 2 & 3
- Coconut Pairing - NVQ Level 2 & 3
- Coconut De-Sheller -NVQ Level 2 & 3
- Machine Operator (Cable Manufacturing) - NVQ Level 2, 3 & 4
- Kithul Tapper - NVQ Level 3
- Rubber Rain Guard Fixer- NVQ Level 2 & 3

## Revised NCSs & Curricular

- Quality Assurance Supervisor (Apparel Production) - NVQ Level 4
- Cake Decorator- NVQ Level 3 & 4
- Plant Nursery Development Assistant- NVQ Level 3 & 4
- Residence Housekeeper- NVQ Level 2, 3 and 4
- Aluminium Fabricator - NVQ Level 2, 3 and 4
- Hairdresser - NVQ Level 3 and 4
- Lapidarist - NVQ Level 2, 3 and 4
- Jewellery Maker - NVQ Level 2, 3 and 4
- Footwear Technician -NVQ Level 3 and 4

NVQ Level 1 - 4

- Phlebotomist - NVQ Level 3
- Tour Guide - NVQ Level 4
- Electrician - NVQ Level 3 & 4
- Construction Craftsman(Masonry) -NVQ Level 3 and 4
- Offset Machine Operator - NVQ Level 2, 3 and 4
- Scuba Diver -NVQ Level 3 and 4
- Tailor - NVQ Level 2, 3 & 4
- Driver - NVQ Level 3 & 4
- Automobile Painter - NVQ Level 3 & 4
- Leather Product Craftsman - NVQ Level 3 & 4
- Wood Craftsman (Furniture) - NVQ Level 3 & 4
- Photographer- NVQ Level 4
- Manufacturing Assistant - NVQ Level 4
- Refrigeration & Air- conditioning Serviceman - NVQ Level 2 & 3
- Construction Equipment Technician –NVQ Level 2, 3 and 4

NVQ Level 5 - 6

## Newly Developed NCSs & Curricular

- Apparel Merchandizing Management (Manufacturing)-NVQ Level 5
- Supply and Materials Management- NVQ Level 5
- Apparel Product Development Technology & Management- NVQ Level 5
- Information and Cyber Security Technology -NVQ Level 5
- Electronic Media -NVQ Level 5
- Textile Coloration and Finishing Technology – NVQ Level 5
- Insurance Technical and Marketing Management - NVQ Level 5
- Medical Laboratory Technology - NVQ Level 6
- Human Resource Management-- NVQ Level 5 & 6
- Fire Engineering Technology - NVQ Level 5
- Library and Information Services - NVQ Level 6
- Digital Media Technology - NVQ Level 5

## Revised NCSs & Curricular

- Marine Machinery Maintenance Technology - NVQ Level 5
- Telecommunication Technology - NVQ Level 6
- Travel and Tour Management- NVQ Level 5 & 6
- Welding Technology – NVQ Level 5 & 6
- Heavy Vehicle Maintenance Technology - NVQ Level 5 and 6
- Jewellery Design and Manufacturing Technology - NVQ Level 5 and 6
- Vocational and Technical Training Delivery- NVQ Level 5
- Automobile Technology - NVQ Level 5 and 6
- Preschool Management - NVQ Level 5 and 6



**උපේක්ෂා විජේබණ්ඩා - සහකාර අධ්‍යක්ෂ**
*ජාතික නිපුණතා සම්මත, විෂයමාලා සහ ජාතික වෘත්තීය සුදුසුකම් අංශය*

# NVQ ක්‍රමවේදය තුලින් නිපුණතාවයට හා සේවා පළපුරුද්දට

## නිපුණතා බලපත්‍රයක්




**සහතික කල නිපුණතාවයට හා පළපුරුද්දට - නිපුණතා බලපත්‍රයක්**

**නිපුණතාව හා පළපුරුද්ද ඇතුළත් - සුහුරු කාඩ්පතක්**

ඔබේ සියලු නිපුණතාවයන්/ සුදුසුකම් සහ පළපුරුද්ද සුහුරු කාඩ්පතක් (SMART CARD) මඟින් තහවුරු කිරීම නිපුණතා බලපත්‍රය මඟින් ඉටු කරනු ලබයි. ඔබ සතු NVQ සහතිකය, සේවා පළපුරුද්ද පිළිබඳ තොරතුරු සෘජුව ම www.nsp.gov.lk වෙබ් අඩවිය වෙත හෝ දුරකථන අංක 011 760 8067 මඟින් විමසා අවශ්‍ය පරිදි ඉදිරිපත් කර නිපුණතා බලපත්‍රය ලබාගත හැකිය. මේ සඳහා ඇගයීම් කළ නිපුණතාවය සමඟ අදාල වෘත්තියේ හි වසරක සේවා පළපුරුද්ද සමඟ සේවයේ නියැලීම අවශ්‍ය වන අතර, රු. 1000 ක ගෙවීමක් කිරීමට අවශ්‍ය වේ. පෙර දැනුම ඇගයීම (Recognition of Prior Learning- RPL) ක්‍රමවේදය මඟින් NVQ සහතිකය ලබා ගන්නා නිපුණ ශිල්පීන්ට NVQ සහතිකය ලබා ගැනීමත් සමඟ "නිපුණතා බලපත්‍රය" (Skills Passport) ලබාගැනීම සඳහා අයදුම් කළ හැකිය.

## නිපුණතා බලපත්‍රලාභියාට ලැබෙන ප්‍රතිලාභ

- තමාගේ නිපුණතාවයට පිළිගැනීමක් ලැබේ.
  නිපුණතාවය සහ පළපුරුද්ද සියලු දෙනාට අන්තර්ජාලය හරහා තහවුරු කර ගත හැකි වීම.
- දේශීය විදේශීය රැකියා අවස්ථාවන් සඳහා මංපෙත් විවර කර දීම.
- අධ්‍යාපන සහ සේවා සහතික ගොනුවක් වෙනුවට සුහුරු කාඩ්පතක් භාවිතා කළ හැකි වීම.
- දේශීය හෝ විදේශ රැකියාවකදී ලබාගත් නිපුණතාවය හා පලපුරුද්ද මත පදනම්ව NVQ සහතිකය සහා නිපුණතා බලපත්‍රය ලබාගත හැකිවීම.

## සේවා යෝජකයාට ලැබෙන ප්‍රතිලාභ

- රාජ්‍ය පිළිගැනීමක් ඇති නිපුණතාවය තහවුරු කළ පිළිගැනීමක් ඇති නිපුණ ශිල්පීන් රැකියා අවස්ථා සඳහා බඳවා ගැනීමට හැකි වීම
- අදාල නිපුණ ශිල්පියාගේ නිපුණතාවය සහ පළපුරුද්ද මාර්ග ගත ක්‍රමය ඔස්සේ තහවුරු කර ගත හැකි වීම.
- නිපුණ ශිල්පීන් බඳවා ගැනීම සඳහා ගතවන කාලය සහ පිරිවැය අවම කරගත හැකි වීම.
- එදිනෙදා අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය වන වෘත්තිකයන්ගේ නිපුණතාවය හා පළපුරුද්ද තහවුරු කර ගැනීමට හැකිවීම.

## අයදුම්කිරීමේ ක්‍රියාවලිය

www.nsp.gov.lk වෙත පිවිස "Apply Now" මත ක්ලික් කරන්න. අවශ්‍ය තොරතුරු සහ මූලික අයදුම්පත පුරවන්න.

මූලික අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු අයදුම්රුට අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම්"සේවා පළපුරුද්ද භාෂා නිපුණතාවය යනාදිය පද්ධතියට ඇතුළත් කිරීම සඳහා පිවිසුම් තොරතුරු සහ ඊට සම්බන්ධ සියලුම උපකාරක ලියකියවිලිවල ස්කෑන් කරන ලද පිටපත් ද උඩුගත(Upload) කළ යුතුය. **සටහන :-** සපයනු ලබන තොරතුරු අදාළ අධිකාරීන් / ආයතන / සංවිධාන සමඟ අප විසින් තහවුරු කරගනු ලැබේ.

අයදුම්කරු රු. 1000/- ක ගාස්තුවක් සෘජුවම TVEC ආයතනය වෙත හෝ අදාල නම් කර ඇත බැංකු ගිණුමට බැරකළ යුතුයි.ගෙවීම් ලදු පතෙහි ස්කෑන් කළ පිටපතක් නිපුණතා බලපත්‍ර (Skills Passport) පද්ධතියට උඩුගත (Upload) කළ යුතුය.

සෑම අදියරක දී ම අයදුම්කරු වෙත දැනුම්දීම යවනු ලැබේ.අයදුම්කරුහට අවසාන SMSදැනුම්දීම ලැබීමෙන් පසු නිපුණතා බලපත්‍ර කාඩ්පත (Skills Passport Card) TVEC ආයතනය වෙතින් ලබාගත හැක.

## රැකියාව පිළිබඳ සාක්ෂි

අයදුම්කරු සේවයේ නියුතු නම් සහා EPF සහ ETF සඳහා දායක වන්නේ නම් රැකියා තොරතුරු තහවුරු කර ගැනීමට ඒකකයට හැකියාව ලබාදෙමින් අදාල ගෙවීම් ප්‍රකාශවල පිටපත් නිපුණතා බලපත්‍ර ඒකකයට(SkilPassport Unit) උඩුගත (Upload) කළ යුතුය.

අයදුම්කරු ඔහුගේ/ඇයගේ සේවා යෝජකයා විසින් නිකුත් කරන ලද රැකියාව තහවුරු කිරීමේ ලිපියක් නිපුණතා බලපත්‍ර ඒකකයට උඩුගත (Upload) කළ යුතුය.

අයදුම්කරු ව්‍යාපාර හිමිකරුවෙකු වන විට ව්‍යාපාර ලියාපදිංචියේ(BR) පිටපතක් සහ එම ලිපිය ලැබුණු දිනට අදාළ ව්‍යාපාරය ක්‍රියාත්මක වන බවට අදාළ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීවරයා අදාල ආකෘතිය පරිදි උඩුගත (Upload) කළ යුතුය.

අයදුම්කරු විදේශ රැකියාවක නිරත සිටින විට ඔහු/ඇය ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්ත කාර්යාංශය විසින් නිකුත් කරන ලද සහතිකයේ පිටපතක්" සේවා යෝජකයා විසින් නිකුත් කරන ලද සේවා ලිපියක්" වීසා බලපත්‍රයේ පිටපතක් උඩුගත (Upload) කළ යුතුය.


011 760 8067

skillspassport@tvec.gov.lk



H.B. **ඉන්දික සම්පත් - සහකාර අධ්‍යක්ෂ (වැ.බ)** -
*තොරතුරු හා පද්ධති අංශය*

# Mature Candidate Route මඟින් අධීක්ෂණ මට්ටමේ සේවා පළපුරුද්ද සහිත අයදුම්කරුවන්ට NVQ Level 5 මට්ටමට සමාන සුදුසුකම් ප්‍රදානය කිරීමේ ක්‍රමය

## (Awarding of NVQ Level 5 Equivalent Qualifications through the Mature Candidate Route.)

### 1 Mature Candidate Route මඟින් අධීක්ෂණ මට්ටමේ සේවා පළපුරුද්ද සහිත අයදුම්කරුවන්ට NVQ Level 5 ට සමාන සුදුසුකමක් ලබාදීමේ ක්‍රමය යනු කුමක් ද?

ඔබ නියැලී සිටින වෘත්තීයට අදාළව ඔබගේ පළපුරුද්ද අනුව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 5 ලබා ගැනීමට තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) මඟින් හඳුන්වා දුන් NVQ චක්‍රලේඛ 01/2021 ට (කර්මාන්ත සේවකයන් සඳහා) හා 2/2022 ට (ඉගැන්වීම් හෝ පුහුණුකිරීමේ ක්‍රියාවලියේ නියතු වන්නන් සඳහා) අනුව ඔබ වෙනුවෙන්ම ක්‍රියාත්මක කරන්නා වූ NVQ සුදුසුකම ලබාදීමේ ක්‍රමයකි.



### 2 කා සඳහා ද?

- යම්කිසි වෘත්තීයකට අදාළව අධ්‍යාපනික / වෘත්තීය පුහුණු ආයතනයක් මඟින් පුහුණුවක් ලබා ගත් හෝ එසේ පුහුණුවක් ලබා නොගත්
- වෘත්තීයකට අදාළව අධීක්ෂක මට්ටමේ (Supervisory Level) තනතුරක රාජකාරීවල නියැලෙන
- මෙම සුදුසුකම සඳහා ඉල්ලුම් කරන දිනය වන විට වයස අවුරුදු 35ට නොඅඩු අයදුම්කරුවන්



සටහන :

*ඉහත කී මූලික සුදුසුකම් ඔබ සපුරන්නේ නම් TVEC ආයතනය විසින් හඳුන්වා දී ඇති පහත සඳහන් ක්‍රම අතුරින් යම්කිසි ක්‍රමයකට ඔබ ඇතුළත් වේ නම් ඔබට මේ සඳහා ඉල්ලුම් කළ හැක.*

#### 1. Industry Workers (කර්මාන්ත සේවකයන් සඳහා)

**ක්‍රමය 01**

**ඔබ නියැලෙන වෘත්තීයට අදාළව NVQ Level 4 මට්ටමේ සහතිකයක් හෝ NCT හෝ NCIT සහතිකයක් ලබා තිබීම.**

**හා**

**අවම වශයෙන් අදාළ වෘත්තියේ අවුරුදු 3ක අධීක්ෂක මට්ටමේ පළපුරුද්දක් සමඟ සම්පූර්ණ අවුරුදු 10 ක සේවා පළපුරුද්දක් තිබීම.**

**ක්‍රමය 02**

**ඔබ නියැලෙන වෘත්තීයට අදාළව TVEC ආයතනය විසින් පිළිගනු ලබන ඩිප්ලෝමා සහතිකයක් (Diploma) හෝ ඊට ඉහළ සහතිකයක් ලබා තිබීම.**

**හා**

**අවම වශයෙන් අවුරුදු 3ක අධීක්ෂක මට්ටමේ පළපුරුද්දක් සමඟ සම්පූර්ණ අවුරුදු 10 ක සේවා පළපුරුද්දක් තිබීම.**

**ක්‍රමය 03**

**ඔබ නියැලෙන වෘත්තීයට අදාළව TVEC ආයතනය විසින් පිළිගනු ලබන සහතික පත්‍ර පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.**

**හා**

**අවම වශයෙන් අවුරුදු 3ක අධීක්ෂක මට්ටමේ පළපුරුද්දක් සමඟ සම්පූර්ණ අවුරුදු 12 ක සේවා පළපුරුද්දක් තිබීම.**

**ක්‍රමය 04**

**අවම වශයෙන් අවුරුදු 3ක අධීක්ෂක මට්ටමේ පළපුරුද්දක් සමඟ සම්පූර්ණ අවුරුදු 15 ක සේවා පළපුරුද්දක් තිබීම.**

## 2. Academic Workers (ඉගැන්වීම හෝ පුහුණුකිරීමේ ක්‍රියාවලියේ නියුතු වන්නන් සඳහා)

**ක්‍රමය 01**

ඔබ නියැලෙන වෘත්තීයට අදාළව NVQ Level 4 මට්ටමේ සහතිකයක් හෝ NCT හෝ NCIT සහතිකයක් ලබා තිබීම.

හා

අවම වශයෙන් රජයේ හෝ පෞද්ගලික අධ්‍යාපන ආයතනයක TVET පාඨමාලා ඉගැන්වීමේ පුහුණු කිරීමේ අවුරුදු 7 ක පළපුරුද්දක් සමඟ සම්පූර්ණ අවුරුදු 10ක සේවා පළපුරුද්දක් තිබීම.

**ක්‍රමය 02**

ඔබ නියැලෙන වෘත්තීයට අදාළව TVEC ආයතනය විසින් පිළිගනු ලබන ඩිප්ලෝමා සහතිකයක් (කාලය මාස 6ට වඩා වැඩි) ලබා තිබීම.

හා

අවම වශයෙන් අවුරුදු 3ක අධීක්ෂක මට්ටමේ පළපුරුද්දක් සමඟ සම්පූර්ණ අවුරුදු 10 ක සේවා පළපුරුද්දක් තිබීම.

**ක්‍රමය 03**

ඔබ නියැලෙන වෘත්තීයට අදාළව ඔඩෑස ආයතනය විසින් පිළිගනු ලබන සහතික පත්‍ර පාඨමාලාවක් (කාලය මාස 6ට වඩා වැඩි) සම්පූර්ණ කර තිබීම

හා

අවම වශයෙන් රජයේ හෝ පෞද්ගලික අධ්‍යාපන ආයතනයක TVET පාඨමාලා ඉගැන්වීමේ/ පුහුණු කිරීමේ අවුරුදු 7ක පළපුරුද්දක් සමඟ සම්පූර්ණ අවුරුදු 10 ක සේවා පළපුරුද්දක් තිබීම.

**ක්‍රමය 04**

අවම වශයෙන් රජයේ හෝ පෞද්ගලික අධ්‍යාපන ආයතනයක TVET පාඨමාලා ඉගැන්වීමේ / පුහුණු කිරීමේ අවුරුදු 15ක පළපුරුද්දක් තිබීම.

## 3. මේ සඳහා අයදුම් කරන්නේ කෙසේද?

**ක්‍රමය 01**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ (www.tvec.gov.lk) ඇති Mature Candidate Route පිටුව වෙත පිවිසෙන්න.

**ක්‍රමය 02**

අයදුම් කිරීමට TVEC ආයතනය ඔබට ක්‍රම 02ක් හඳුන්වා දී ඇත.

සාමාන්‍ය ක්‍රමය (Normal Process)
NVQ Level 5 වලට අදාල නිපුණතා සම්මතයන් ඇති සියලුම ක්ෂේත්‍රයන් සඳහා මෙම ක්‍රමයට වර්ෂයකට කණ්ඩායම් 2 ක් බඳවා ගනු ලැබේ.

**ක්‍රමය 03**

කඩිනම් ක්‍රමය - The Expeditions (Speedy) Prosess
NVQ Level 5 වලට අදාල නිපුණතා සම්මතයන් ඇති සියලුම ක්ෂේත්‍රයන් සඳහා මෙම ක්‍රමයට තනි පුද්ගලයෙක් ලෙස හෝ කණ්ඩායමක් ලෙස ඕනෑම වේලාවක අයදුම් කල හැකි වන අතර ක්ෂේත්‍රයන් කිහිපයක් හැරුණු විට අනෙකුත් සියලුම ක්ෂේත්‍රයන් සඳහා තනි පුද්ගලයෙකු ලෙස අයදුම් කිරීමේ දී උපරිම මාසයක් තුළ ඔබ සුදුස්සෙකු නම් ඔබට මෙම සුදුසුකම ලබා ගත හැක.

අයදුම් කිරීමට,

සාමාන්‍ය ක්‍රමය (Normal Process)
www.tvec.gov.lk - Mature Candidate Route - Normal Process Online Application Form

කඩිනම් ක්‍රමය - The Expeditions (Speedy) Prosess
www.tvec.gov.lk - Mature Candidate Route - Expeditions (Speedy) Process

## 3 මේ සඳහා අයදුම් කරන ආකාරය

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) වෙබ් අඩවියෙහි (www.tvec.gov.lk) පළ කර ඇති Mature Candidate Online Application Form නිසිපරිදි සම්පූර්ණ කර (දී ඇති උපදෙස් වලට අනුව) TVEC ආයතනයට යොමු කිරීම.

## 4 NVQ මට්ටම 5ට සමාන කිරීමේ සුදුසුකම ඔබට ලබා දීමේදී ඒ සඳහා ඔබ සුදුස්සෙකු ද යන්න ඇගයීමට ලක් වනුයේ,

ඔබ අප වෙත එවන අයදුම්පත අදාළ ඇගයීම් කමිටුව විසින් ඇගයීමට ලක් කර මෙම ක්‍රමවේදය යටතේ NVQ මට්ටම 5ට සමානකිරීමේ සුදුසුකම ලබා ගැනීම සඳහා වූ මූලික සුදුසුකම් සපුරා ඇත්තෙකුදැයි පරීක්ෂා කරනු ලැබේ.

සපුරා නැත / සපුරා ඇත

ඔබගේ කළමණාකරනය පිළිබඳ දැනුම හා හැකියාව ඇගයීම සඳහා කළමණාකරනයට අදාළ වූ ලිඛිත විභාගයට පෙනී සිටීම

අසමත් / සමත්

සම්මුඛ පරීක්ෂණය මඟින් අදාළ වෘත්තීය දැනුම හා හැකියාව පරීක්ෂා කිරීම

නිර්දේශ නොවීම / නිර්දේශ වීම

NVQ මට්ටම 5 ට සමානකිරීමේ සුදුසුකම ලබා දීම.

මට්ටම සමානකිරීමේ සුදුසුකම ලබා ගත නොහැක.


- *යම් අයදුම්කරුවෙකු ඉහත සඳහන් කර ඇති යම් කිසි ඇගයීම් මට්ටමකින් අසමත් වුවහොත් ඔහුට / ඇයට අසමත් වූ ඇගයීම් මට්ටමේ සිට නැවත කොමිෂන් සභාවේ නිර්ණායකයන්ට යටත්ව අයදුම්කිරීමට හැකියාවක් පවතී.*




## 5 ඔබ ලබා ගන්නා මෙම සුදුසුකමේ ඇති වැදගත්කම කුමක්ද ?

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2009 අනුව පවතින රාජ්‍ය ආයතනවල වෘත්තීන්ට ඉල්ලීම් කිරීමේදී බොහෝ වෘත්තීන් සඳහා NVQ මට්ටම් දක්වා ඇති අතර ඔබ මෙම NVQ මට්ටම් 5ට සමාන සුදුසුකම ලබා ගැනීම මඟින් ඒ මට්ටම් සඳහා වු වරප්‍රසාද ඔබට ලබාග ැනීමට අවස්ථාවක් ලබා ගත හැක. කෙසේ නමුදු මෙම ආකාරයෙන් NVQ මට්ටම 5ට සමාන සුදුසුකම ලබා ගැනීම, එයට වඩා ඉහළ NVQ මට්ටම් ලබා ගැනීම සඳහා උසස් අධ්‍යාපනයට යොමු වීමට හෝ උපදේශන කටයුතු සඳහා යොමුවීමට හෝ සුදුසුකමක් ලෙස පිළිනොගැනේ.






**හාෂිනී විතානගේ - සහකාර අධ්‍යක්ෂ**
*පුහුණු සම්මත විෂයමාලා හා ජාතික වෘත්තීය සුදුසුකම් අංශය*

# වෘත්තීය මාර්ගෝපදේශන සේවාව නියාමනය තුලින් ඉහළ ගුණාත්මක සේවාවක් ලබා දීම

දිවයින පුරා විවිධ ආයතන වලින් ක්‍රියාත්මක වෘත්තීය මාර්ගෝපදේශන සේවාව වඩාත් ගුණාත්මක යාවත්කාලීන සේවාවක් ලෙස පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය තත්ව ආරක්ෂණ වැඩ පිලිවෙළක් ක්‍රියාත්මක කිරීමට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පියවර ගෙන ඇත.

වර්තමානයේ දී තරුණ තරුණියන්ට, වැඩිහිටියන්ට සහ වෘත්තීය ක්ෂේත්‍රයන් වෙනස් කිරීමට අපේක්ෂිත පිරිස් සඳහා නිසි වෘතිතීය මාර්ගෝපදේශන සේවාවක් ලබා දීම අත්‍යවශ්‍ය වී ඇත. තම අනාගත වෘත්තීය අවස්ථාවන් නිවැරදිව තම දක්ෂතාවයන්ට, හැකියාවන්ට මෙන්ම කැමැත්ත අනුව තෝරාගෙන, අනාගත වෘත්තීය ඉලක්ක ජය ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු මත පදනම්ව, සුදුසුකම්ලත් වෘත්තීය මාර්ගෝපදේශකයින්ගේ නිසි මගපෙන්වීමක් ලබා ගැනීමට හැකියාව තිබිය යුතුය.

ඒ අනුව ප්‍රධානතවම,

- වෘත්තීය මාර්ගෝපදේශනයේ නියුතු වෘත්තිකයින් හට නිසි පිළිගැනීමක් ලබා දීම.
- වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ඇගයීමකට ලක් කිරීම හා ලියාපදිංචි කිරීම.
- ඒකාබද්ධ පොදු සේවාවක් ලෙස වෘත්තීය මාර්ගෝපදේශන සේවාව ක්‍රියාත්මක කිරීම.
- වෘත්තීය මාර්ගෝපදේශකයින්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට.

අවශ්‍ය මූලික කටයුතු තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ මූලිකත්වයෙන් ස්ථාපිත කර ඇති වෘත්තීය මාර්ගෝපදේශනයේ නිරත සියලු ආයතන නියෝජනය කරන ජාතික වෘත්තීය මාර්ගෝපදේශන නියාමන කමිටුවේ නිර්දේශය අනුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.



ඒ අනුව වෘත්තීය මාර්ගෝපදේශන සේවාවේ නිරත වෘත්තිකයින් සඳහා,

- මූලික ලියාපදිංචියක් ලබා දීම
- පොදු සුදුසුකම් රාමුවක් තුල ක්‍රියාත්මක වීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වෘත්තිකයින් සඳහා ජාතික වෘත්තීය නිපුණතා සම්මතයක් සංවර්ධනය කිරීම.
- වෘත්තීය මාර්ගෝපදේශන වෘත්තිකයින් සඳහා NVQ සුදුසුකම් හා නිපුණතා බලපත්‍රයක් ලබා දීම.
- ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමවේදය තුලින් ඩිප්ලෝමා සුදුසුකම් ලබා දීම සඳහා අවශ්‍ය නිපුණතා සම්මතය සංවර්ධනය කිරීම.
- වෘත්තීය මාර්ගෝපදේශන වෘත්තිකයින් සඳහා සේවා හැඳුනුම්පතක් ලබා දීම.
- වෘත්තීය මාර්ගෝපදේශන සේවාව සඳහා ආචාර ධර්ම පද්ධතියක් සංවර්ධනය කිරීම.
- වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම.

## වෘත්තීය මාර්ගෝපදේශන සඳහා NVQ 5 ඩිප්ලෝමා මට්ටම

වෘත්තීය මාර්ගෝපදේශන සේවාවේ නිරත වෘත්තිකයින් සඳහා පොදු සුදුසුකම් ක්‍රමවේදයක් හඳුන්වා දීම සඳහා සංවර්ධනය කරන ලද වෘත්තීය මාර්ගෝපදේශන වෘත්තිකයින් (Career Guidance Practitioner) නිපුණතා සම්මතය ට අමතරව වෘත්තීය මාර්ගෝපදේශනය සංවර්ධනය (Career Guidance Development ) ලෙස NVQ 5 මට්ටමේ ඩිප්ලෝමා සම්මතයක් සකස් කර ඇති අතර එම සම්මතය වලංගු (Validation ) කිරීම සඳහා පියවර 2022ග12ග02 දින NAITA ආයතනයේදී ගන්නා ලදී. වෘත්තීය මාර්ගෝපදේශන සේවාවේ නිරත නිලධාරීන් සඳහා මෙම අවස්ථාව ලබා ගත හැකිවනු ඇත.





**මංජුල විදානපතිරණ - වැඩ බලන අධ්‍යක්ෂ**
*කර්මාන්ත සම්බන්ධතා අංශය*


**Tertiary and Vocational Education Commission**
**'Nipunatha Piyasa', 354/2, Elvitigala Mawatha,**
**Colombo 05, Sri Lanka.**
**Tele : +94(0) 11 760 8000    Fax : +94(0) 11 255 5007**
**info@tvec.gov.lk,   www.tvec.gov.lk**


**අදහස් සහ යෝජනා**